කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

Centre for Open and Distance Learning
University of Kelaniya-Sri Lanka

# ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය
# (බාහිර) - 2008

## මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ දර්ශනය -BUPH- E2025

## බෞද්ධ සමාජ දර්ශනය, පාරභෞතික ප්‍රස්තුත හා සමයාන්තර චින්තා

**ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි  කාලය : පැය 03 යි

---

01. සමාජ ප්‍රභවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් මගින් දේව නිර්මාණවාදී සංකල්ප ප්‍රතික්ෂේප වන අයුරු අදාළ මූලාශ්‍රය අනුසාරයෙන් පැහැදිලි කරන්න.

02. මානව වර්ගයා පිළිබඳ වෛදික වර්ගීකරණයන් කෙටියෙන් දක්වා, බුදුසමය මානව සංහතියේ ඒකත්වය ප්‍රකට කරන අයුරු ගෙනහැර දක්වන්න.

03. ධනය ඉපයීම හා පරිභෝජනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් සමාජ ප්‍රගතියට හා සහජීවනයට ඉවහල් වන අයුරු පැහැදිලි කරන්න.

04. පුද්ගලයාගේ හා සමාජයේ පරිහානියට තුඩුදෙන මානව චර්යාවන් මූලාශ්‍රයානුසාරයෙන් ගවේෂණය කරන්න.

05. සමයාන්තර ගැටුම් සංසිඳවීමෙහි ලා සාමයික සහජීවනය හා සහනශීලීත්වය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කර ගත හැකි අයුරු උදාහරණ සහිතව පෙන්වා දෙන්න.

06. 'රාජ්‍ය පාලනයට අදාලව විවිධ සූත්‍රයන්හි දැක්වෙන බෞද්ධ ඉගැන්වීම් නිසි පරිදි පෙළ ගස්වා ගැනීමෙන් නිවැරදි බෞද්ධ දේශපාලන දර්ශනයක් ගොඩනගා ගත හැකිය.' සාකච්ඡා කරන්න.

07. ඊශ්වරවාදී චින්තනයේ මූලික ලක්ෂණ පැහැදිලි කොට, එවැනි චින්තනයකින් පුද්ගල පෞරුෂයට සිදුවන බලපෑම මූලාශ්‍රය නයින් පරීක්ෂා කරන්න.

08. දස අව්‍යාකෘත ධර්ම හඳුන්වා බුදුසමය ඒවා ඨපනීය ලෙස සලකා ඇත්තේ කවර හෙයින්දැයි විමර්ශනය කරන්න.

09. ආත්මවාදය පිළිබඳ හැඳින්වීමක් කොට එය ප්‍රතික්ෂේප කිරීමෙහි ලා බුදුසමයෙහි උපයුක්ත විධික්‍රම ගෙන හැර දක්වන්න.

10. නිර්වාණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම පාරභෞතික ප්‍රස්තුතයක් ලෙස නොසලකා විවරණය කළ හැකි බව මූලාශ්‍රය නයින් සනාථ කරන්න.

**********************